// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1941/38 - 2015 නොවැම්බර් මස 20 වැනි සිකුරාදා - 2015.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය.*: බිය/3/1/1/262/1 ගොනුව.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍යා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ. අංක 269බී, ඉහළ බියන්විල මධ්‍යම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉහල බියන්විල ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරේ අංක ගම්. 3963 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0436 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල.

1. **කැබලි අංක 1**

ඉඩමේ නම: කෝන්ගහවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. ඇම්. ඩී. සිරිපාල, අංක 220/11, ජය මාවත. ඉහළ බියන්විල, කඩවත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0436.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00ට බියගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2015 නොවැම්බර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්. එච්. වී. පුෂ්පමාලා,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2015 නොවැම්බර් මස 16 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-240

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 22615 - 16 - (2015/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.